**සබරගමුව පළාත් සභාව -2022**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

සබරගමුව පළාත් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 14 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | පළාත් සභාව රඳවා ගැනීම් බදු සඳහා බැඳියාවක් නොමැති බැවින් සමාලෝචිත වර්ෂය තුළ බැංකු පොළියෙන් අඩුකළ බදු, පොලී ගිණුම බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට ගැලපීම නිසා වර්ෂයේ ආදායම රු.9,614,383 කින් අඩු වී තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී අදාල අගයන් සංශෝධනය කර සංසන්දනාත්මක ලෙස ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලද බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු ය. |
| (ආ) | පළාත් ආයතන 03 ක පැවැති ජංගම නොවන වත්කම් රු.2,329,009,388 ක් පළාත් සභා අරමුදලේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | 2023 වර්ෂය තුළදී තක්සේරු කර ගිණුම් ගත කර අවසන් කිරීමට උපදෙස් දී ඇති බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අරමුදලේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ, ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ කෙරීගෙන යන වැඩ රු.15,705,829 ක් දක්වා තිබුණ ද, එම කාර්යාලයේ පොත්වල එවැනි වටිනාකමක් නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී මෙම අගයන් ඇතුලත් කිරීමට උපදෙස් ලබාදීමට සටහන් කරගන්නා ලද බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු ය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.5.1 ශීර්ෂය 800 - ආණ්ඩුකාරවර කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එක් අයෙකුට හිමි ඉන්ධන දීමනාව තවත් අයෙකුට ලබා දීමට අංක පීඑස්/සීඑස්ඒ/00/1/4/2 හා 2018 ඔක්තෝබර් 12 දිනැති ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණි. එහෙත්, ගරු ආණ්ඩුකාරතුමා දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළ ඔහුට නිශ්චය කළ රු.725,000 ක ඉන්ධන දීමනාව පෞද්ගලික ලේකම්වරිය වෙත ගෙවා තිබුණි. | ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාට හිමි ඉන්ධන දීමනාව ලබා දෙන ලෙස එතුමා ලබා දී තිබූ නියෝගය අනුව 2022 සැප්තැම්බර් මස ඉන්ධන දීමනාව එතුමාගේ පෞද්ගලික ලේකම් වෙත ලබා දී ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | ආණ්ඩුකාර ලේකම් කාර්යාලයට අයත් වාහනයක් 2020 වර්ෂයේදී අනතුරට පත්ව අළුත්වැඩියා කර තිබුණ ද, අලුත්වැඩියාවට අදාල රු.5,983,937 ක වන්දි මුදල රක්ෂණ ආයතනයෙන් ලබාගෙන නොතිබුණි. | කඩිනමින් පරීක්ෂණ කටයුතු අවසන් කර වාර්තාව ඉදිරිපත් කරන බව. | වන්දි මුදල කඩිනමින් ලබාගත යුතු ය. |
| (ඇ) | හදිසි අවස්ථා අරමුදල ස්ථාපිත කළ ප්‍රඥප්තියේ 2(1) වගන්තිය ප්‍රකාරව සබරගමුව පළාතේ අනපේක්ෂිත වියදම් දැරීමේ අරමුණින් හදිසි අවස්ථා අරමුදල ඇති කර තිබුණි. එහෙත්, මේ වන විට වසර 33 ක් ඉක්ම ගොස් තිබුණ ද, පළාත තුළ සිදු වූ ගංවතුර, කොරෝනා වසංගතය වැනි උවදුරු සඳහා කිසිදු මුදලක් වැයකර නොතිබුණි. | හදිසි අවස්ථා අරමුදල යටතේ මුදල් උපයෝජනය කිරීමේ අවශ්‍යතාවයක් මතු නොවූ බව | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

### 1.5.2 ශිර්ෂය 801 - පළාත් සභා ලේකම් කාර්යාලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් 18 කින් කාර්යසාධනයට අදාළ කාර්යයන් 09 කි. පළාත් සභාව අක්‍රිය තත්ත්වයේ පවතින බැවින් එම කාර්යසාධනයට අදාළ කාර්යයන් සියල්ල අක්‍රියව පැවතුණි. | පළාත් සභා විසුරුවා හැර ඇති බැවින් නැවත මැතිවරණයක් පවත්වා සභාව ස්ථාපිත වන තුරු කාර්යසාධනයට අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති බව. | සභාව අක්‍රිය බැවින් කාර්ය මණ්ඩලය ඵලදායී ලෙස අනුයුක්ත කළ යුතු වේ. |
| (ආ) | සභා ලේකම් කාර්යාලයට අනුයුක්තව 22 දෙනෙකු සේවය කරමින් සිටි. එහෙත්, පළාත් සභාව විසුරුවා හැරීම නිසා කාරක සභා ඇතුළු විශාල කාර්යයභාරයක් ද අක්‍රිය වී තිබුණි. එසේ වුවද, වර්ෂ 05 ක කාලයක සිට පවතින සේවක අතිරික්තය, සභාවේ කාර්යයන් නැවත ආරම්භ කරන තෙක් ඵලදායී ලෙස වෙනත් කාර්යාලවලට අනුයුක්ත කිරීමට ඇති හැකියාව සොයා බලා නොතිබුණි. | පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු සෑම වසරකම නැවත ස්ථාපිත වන ඇතැයි සලකා ඇස්තමේන්තු සකස් කිරීම් ආදිය සිදු කරන ලදී. ඒ අනුව කාර්යාලයේ කාර්ය මණ්ඩලය අතිරික්ත යැයි සලකා බැලීමක් නොකරන ලද බව. | සේවක අතිරික්තය ඵලදායි ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 1.5.3 ශිර්ෂය 802 – පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| විභාග අපේක්ෂකයින් නොමැති තත්ත්වයක දී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022 වර්ෂය තුළ විභාග පැවැත්වීමට සැලසුම් කිරීම නිසා අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම මත විභාග 13 ක් පවත්වා නොතිබුණි. | සමහර විභාග සඳහා අයදුම්පත් ඉදිරිපත් වී නොතිබූ බැවින් එම විභාග පවත්වා නොමැති බව. | විභාග සැලසුම් කිරීමේ දී සියලුම අංශ සම්බන්ධීකරණය විය යුතු ය. |

### 1.5.4 ශිර්ෂය 804 – පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ ලද ආයෝජන පොළී ආදායම රු.63,096,062 ක් වුවත්, එම ආදායම ඇස්තමේන්තු කර නොතිබුණි. | පෙර වර්ෂයේ දී සැලසුම් නොකරන ලද කාර්යයක් බැවින් ඇස්තමේන්තු කිරීමට නොහැකි වී ඇති බව. | ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සබරගමුව පළාත් සභාවට අයත්, කුරුවිට පිහිටි වටිනාකම රු.1,500,000 ක් වූ නිල නිවාසයක් කිසිදු අලුත්වැඩියාවක් නොමැතිව වසර 20 ක පමණ කාලයක සිට අභාවිතව පැවැතිණි. මෙම නිලනිවාසයෙහි භාරකාරීත්වය කිසිදු ආයතනයකට පවරා නොතිබුණි. | මෙම නිල නිවාස පළාත් සභා පිහිටුවීමට පෙර මහා මාර්ග දෙපාර්තමේන්තුව යටතේ පැවැති බව. | වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.6.1(අ) (ii) මාර්ගෝපදේශයට අනනුකූලව, පිළියෙල කර තිබූ තාක්ෂණික පිරිවිතර පිළිබඳව සමාලෝචනය නොකර රු.1,140,000 කට ලැප්ටොප් පරිගණක 06 ක් මිළ දී ගෙන තිබුණි. | මිල ගණන් කැඳවන ලද පිරිවිතර සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශය ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | අමාත්‍ය මණ්ඩලයේ හා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලැබී තිබුණ ද, සබරගමුව පළාත් සභා සංකීර්ණය ඉදිකර ඇති රු.9,280,000 ක් වටිනා ඉඩම, 2023 අප්‍රේල් 09 දිනවන විටත් පළාත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | ඉඩමට අදාළ නිදහස් දීමනා පත්‍ර නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලැබීමෙන් පසුව ඉඩම පවරා දීමේ කටයුතු සිදු කරන බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ දන්වා ඇති බව. | ඉඩම පළාත් සභාව වෙත පවරා ගත යුතු වේ. |

**1.5.5 ශීර්ෂ අංක 808 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------------- | ------------- |
| (අ) | අංක 03/2022 හා 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය අනුව, අඩක් නිම කළ ව්‍යාපෘතිවල අවශ්‍යම කොටස් නිමකළ යුතු වේ. එහෙත්, ඊට අනනුකූලව කෑගල්ල, දෙහිඕවිට, රඹුක්කන ප්‍රදේශවල වූ රු.524,613,811 ක ඉදි කිරීම් 40 ක් අතරමග නවතා තිබුණි. | ඉදිකිරීම් කටයුතු ප්‍රයෝජනයට ගත හැකි අකාරයෙන් ඉදිකිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව. | චක්‍රලේඛය අනුව ජනතාවගේ අපහසුතා අවම වන පරිදි හා ඒවායේ දිගුකාලීන පැවැත්ම තහවුරු වන පරිදි එම නිම කිරීම් සිදුකළ යුතුය. |
| (ආ) | දෙහිඕවිට ප්‍රදේශයේ 2021 වර්ෂයේ ආරම්භ කළ රු.40,576,971 කට ගිවිසුම්ගත වූ සෞඛ්‍ය ගොඩනැගිලි 06 ක ඉදිකිරීම්වල ප්‍රගතිය 2022 දෙසැම්බර් 31 දිනට සියයට 10 ත් සියයට 82 ත් අතර පරාසයක විය. | ඉතිරි වැඩ අවසන් කිරීමට අමාත්‍යාංශය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | චක්‍රලේඛය අනුව ජනතාවගේ අපහසුතා අවම වන පරිදි හා ඒවායේ දිගුකාලීන පැවැත්ම තහවුරු වන පරිදි එම නිම කිරීම් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රඹුක්කන විධායක ඉංජිනේරු කාර්යාලය සඳහා අතිරේක විධායක ඉංජිනේරු තනතුරක් අනුමත කර නොතිබියදී, සබරගමු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් 2020 ජූලි සිට එම තනතුර සඳහා නිලධාරියෙකු අනුයුක්ත කර තිබුණි. | පිළිගෙන ඇති බව. | අනුමත තනතුරු සඳහා පමණක් අනුයුක්ත කිරීම් සිදු කළ යුතු ය. |
| (ඈ) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා කාර්යාලය භාරයේ පවතින නිල නිවාස 08 ක හිමිකම තහවුරු කර ගැනීමට නොහැකි වීමෙන් වසර 30 ක පමණ කාලයක සිට එම නිල නිවාසවල සිටින අනවසරකරුවන් ඉවත් කිරීමට නොහැකි වී තිබුණි. | පළාත් සභාව වෙත පැවරීමට අදාළ ලිපි ලේඛන නිවැරදි බවට තොරතුරු සොයා ගැනීමට නොහැකි බවත්, මේ සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස් වෙතින් තහවුරු කර ගන්නා ලෙසත් දැනුම් දී ඇති බව. | වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

**1.5.6 ශීර්ෂ අංක 809 - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේපළක් පැවරීමේදී එම දේපළෙහි නිවැරදි වටිනාකමට මුද්දර ගාස්තු ගෙවා තිබීම පිළිබඳ පරීක්ෂා කිරීම පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් විය. එහෙත් | | |
| (i) | 2007 - 2016 වර්ෂ අතර කාලය තුළ අවස්ථා 05 ක දී තක්සේරු කළ හිඟ මුද්දර ගාස්තු හා දඩ මුදල් රු.258,265 ක් අයකර නොතිබුණි. | රු.407,105ක හිඟ මුදලින් රු.148,840 ක් මේ වන විට අය කර ඇති බව. | හිඟ මුද්දර ගාස්තු හා දඩ නොපමාව අයකළ යුතුය. |
| (ii) | 2019 සහ 2021 වර්ෂවල දී ලියාපදිංචි කළ රු.95,400,000 ක් වූ තෑගි ඔප්පු 59 ක් සහ 2021 වර්ෂයේ රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කළ රු.ලක්ෂ 05 ට වැඩි ඔප්පු 3,004 ක් සඳහා අයකළ මුද්දර ගාස්තුවල නිවැරදිතාව තක්සේරු කර නොතිබුණි. | පවතින නිලධාරී හිඟය නිසාත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය මඟින් ලබාදුන් තොරතුරු අසම්පූර්ණ වීම නිසාත් ලිපිගොනු බහුතරයක් විවෘත කර ගැනීමට නොහැකි වී ඇති බව. | ගෙවන ලද මුද්දර බදු ආදායම් තක්සේරු කර අයකළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ අයකරගත යුතු හිඟ පිරිවැටුම් බදු රු. 3,611,313 ක් 2022 වර්ෂයේදී ලියා හැර තිබුණි. ඒ හැර පිරිවැටුම් බද්ද අහෝසි කළ 2011 ජනවාරි 01 දිනට පැවති ශේෂයෙන් රු. 8,107,896 ක් තවදුරටත් අයවීමට පැවැතිණි. | අහෝසි වූ බද්දක් බැවින් දිගින් දිගටම ගෙවීම හා ඉදිරිපත් වීම පැහැර හැර තිබුණි. හිඟ බද්ද අය කිරීමට වෙනත් කිසිදු විකල්පයක් නොමැති අවස්ථාවලදී පමණක් මෙසේ බදු කපා හරින බව. | හිඟ ආදායම් අයකළ යුතු ය. |

**1.5.7 ශීර්ෂය 810- නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුභ සාධන, පරිසර, ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු පළාත් අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------------- | ------------- |
| (අ) | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයා වෙත වර්ෂ 2015-2021 අතර කාලය තුළ ලද විෂමාචාර 21 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු 2022 දෙසැම්බර් දක්වාම නිමකර නොතිබුණි. තවද, විනය පරීක්ෂණ 06 ක් සඳහා විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීමට මාස 06-68 අතර කාලයක් ගත වී තිබුණි. | මින් ඉදිරියට සිදුකරන විනය පරීක්ෂණ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කරන බව. | විනය පරීක්ෂණ අප්‍රමාදව අවසන් කළ යුතු ය. |
| (ආ) | 2017 වර්ෂයේදී ප්‍රධාන අමාත්‍යාංශයට අයත් වාහනයකට වූ හානිය පූර්ණ හානියක් ලෙස සලකා රක්ෂණ ආයතනය විසින් රු.මිලියන 25 ක රක්ෂණ වන්දියක් ගෙවීමට එකඟ වී තිබුණි. එසේ වුවත්, එවකට සිටි ප්‍රධාන ලේකම් විසින් එම වන්දිය ප්‍රතික්ෂේප කරමින් හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට ද පටහැනිව, එය අලුත්වැඩියාව සඳහා 2018 වර්ෂයේ පෞද්ගලික ගරාජයකට භාර දී 2019 පෙබරවාරි මාසයේදී රු.3,063,690 ක අත්තිකාරමක් ද උක්ත රක්ෂණ නියෝජිත ආයතනය වෙතින් පෞද්ගලික ගරාජය වෙත ලබා දී තිබුණි. එහෙත් දැනට වර්ෂ 04 ක කාලයක් ගත වී තිබුණ ද, මේ දක්වාම මෝටර් රථය පළාත් සභාව වෙත ගෙනවිත් නොතිබූ අතර, සම්පූර්ණ රක්ෂණ වන්දි මුදල ද ලබාගෙන නොතිබුණි. | රථයේ අළුත්වැඩියා නිමකර තිබුණ ද මෙතෙක් රක්ෂණ වන්දි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් නොගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව. | රජයට සිදු වී ඇති අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | වර්ෂ 2000 - 2018 අතර කාලය තුළ වාහන අනතුරු 30 ක් නිසා සිදු වූ රු.32,736,100 ක අලාභය පළාත් මූල්‍ය රීති 54 ප්‍රකාරව අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | අලාභ අයකර ගැනීම හෝ කපා හැරීම්වලට අයත් දෙපාර්තමේන්තු පරීක්ෂණ අවසන් කර ඇති බව. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | මාස 06ත් වසර 06ත් අතර කාල පරාසයක් තුළ නිකුත් කළ රු.76,488,131ක අත්තිකාරම්, 2022 වර්ෂය අවසානය දක්වාම නිරවුල්කර නොතිබුණි. | ලැබෙන අක්මුදල් ප්‍රමාණය අනුව බිල්පත් නිරවුල් කර අත්තිකාරම් පියවා ගන්නා බව. | රජයට සිදුවී ඇති අලාභය අය කළ යුතු ය. |

**1.5.7.1 සබරගමුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** | | |
| (i.) | අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට අවසන් තොගය රු.970,337 ක් ද, තථ්‍ය ප්‍රත්‍යාගණන ලාභය රු.4,500,000 ක් ද වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | මෙය මුද්‍රණාල තොගය ආශ්‍රිතව සිදු වී ඇති අතර විගණනයෙන් ලැබුණු උපදෙස් අනුව දැනටමත් ජ'නල් සටහන් යෙදීමට කටයුතු කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු ය. |
| (ii.) | නොනිමි වැඩ යටතේ දැක්විය යුතු වාහන 13 ක අලුත්වැඩියා වියදම් රු.1,576,967 ක් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අඩුවෙන් වෙන් කර ඇති මුදල ජ'නල් සටහන් යොදා නිවැරදි කිරීමට පියවර ගෙන ඇති බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු ය. |
| (iii) | පාරිතෝෂික ගෙවීම් පනත අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ගණනය කළ රු.10,600,363 ක පාරිතෝෂික අරමුදල් ශේෂය ආයෝජනය කර නොතිබුණි. | ඉදිරියේදී අධිකාරියේ මූල්‍ය තත්ත්වය යහපත් වූ විට පාරිතෝෂික අරමුදලේ ශේෂය වෙනම ගිණුමක තැන්පත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | **මෙහෙයුම් සමාලෝචනය** | | |
| (i) | පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් අධිකාරිය සම්බන්ධයෙන් 2022 ජනවාරි මාසයේ නිකුත් කළ මූලික විමර්ශන වාර්තාව මඟින් හඳුනාගත් රු.54,394,444 ක හානි 03 ක් වෙනුවෙන් වූ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාළ පරීක්ෂණ කමිටුවෙන් ලද උපදෙස් පරිදි හානි පාඩු කමිටුවක් පත්කර ගැනීම සඳහා වූ ඉල්ලීම ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇති බව. | අලාභ හානි සම්බන්ධව මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) | ඉදිකිරීම් නිමකළ කර්මාන්ත 20 කට අදාළව, මුදලින් ලබාගත් රු.2,168,803 ක් වූ ඇප තැන්පතු පියවා නොතිබුණි. | ඉදිරියේදී සිවිල් අංශයෙන් ලැබෙන ලාභයෙන් පියවීමට කටයුතු කරන බව. | ඇප තැන්පතු නිරවුල් කළ යුතු ය. |
| (iii) | ඉදිකිරීම්, අධිකාරියේ ප්‍රධාන කාර්යයක් වුවද, ICTAD ආයතනයේ ලියාපදිංචිය ලබා ගෙන නොතිබුණි. | බාහිර ආයතනවල ටෙන්ඩර් ඉදිරිපත් නොකරන නිසා එම ලියාපදිංචිය ලබා නොගත් බව. | ඉදිකිරීම් කටයුතුවල නියැලෙන නිසා ලියාපදිංචි විය යුතු ය. |
| (iv) | අධිකාරිය භාරයේ වූ වාහන 20 ක් හා යන්ත්‍ර 9 කින් වාහන 17 ක් හා යන්ත්‍ර සියල්ලම 2019 වර්ෂයේ සිට අභාවිතව පැවතුණි. | ඉදිකිරීම් කර්මාන්තයේ සිදුවන වර්ධනය සමඟ එම වත්කම් නැවතත් කුලී පදනම මත ලබා දිය හැකි බව. | වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතු ය. |

**1.5.7.2 පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | බෝට්ටු සවාරි සඳහා 2017 මාර්තු මාසයේදී රු.388,000 කට බෝට්ටුවක් මිල දී ගෙන එම වර්ෂයේදී රු.96,520 ක් ආදායම් උපයා තිබූ අතර, අනාරක්ෂිත බව නිසා බෝට්ටු සවාරි වසර 05 ක් තිස්සේ නවතා තිබුණි. | මා ඔයේ කිඹුලෙකු ගැවසීම නිසා බෝට්ටු සවාරිය නවතා ඇත. මේ පිළිබඳව වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව දැනුවත් කළ ද මේ දක්වා කිඹුලා ඉවත් කර නොමැති බව. | වත්කම් නිසි පරිදි උපයෝජනයට කටයුතු කළ යුතු ය. |
| (ආ) | උද්‍යානය ආරම්භ කර වර්ෂ 06 ක් ගත වී තිබුණ ද, කාර්ය මණ්ඩල හා වැටුප් පරිමාන සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවෙන් අනුමැතියක් නොලැබුණි. එහෙත් මේ පිළිබඳ නැවත විමසා බැලීමට සටහන් කර ගත් බව. | කාර්ය මණ්ඩලය හා වැටුප් පරිමාන සම්බන්ධව අනුමැතිය ලබා ගත යුතු ය. |

**1.5.7.3 සබරගමුව පුස්තකාල සේවා මණ්ඩලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | ගිණුම් පොත්පත් පවත්වා තිබුණද, මණ්ඩලය ආරම්භ කළ 2015 වර්ෂයේ සිට මේ දක්වාම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබීම නිසා මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීමට නොහැකි වී තිබුණි. | ප්‍රධාන අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේ දී පුස්තකාලයේ ගණුදෙනු සමඟ ම ඉදිරිපත් කරනු ලබන බව. | ප්‍රඥප්තිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය. |
| (ආ) | පරමාර්ථ 17 ක් ඉටුකර ගැනීමට මෙම මණ්ඩලය පිහිටුවා තිබුණි. එහෙත්, ඉන් පරමාර්ථ 10 ක්ම පුස්තකාල සේවා මණ්ඩලය ආරම්භ කළ දින සිට මේ දක්වාම ඉටු කර නොතිබුණි. ඉටු කළ පරමාර්ථ 07 න් 04 ක් ම මධ්‍ය පුස්තකාලය හා බැඳී පැවැතිණි. පරමාර්ථ 02 ක නිශ්චිත කාර්යභාරයක් නොවුණි. පාඨකයන් දැනුවත් කිරීමේ ඉතිරි පරමාර්ථය සඳහා 2022 වර්ෂය තුළ වැඩසටහන් 02 ක් පවත්වා තිබුණි. ඒ අනුව පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජිකයන් වෙත 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා දීමනා ලෙස රු.5,545,424 ක් ගෙවා ඇතත් පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවීමේ පරමාර්ථ මුදුන් පමුණුවා ගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ සිට ප්‍රඥප්තියේ සඳහන් පරමාර්ථ 17ක් ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති බව. | ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2016 වර්ෂයේදී රු.8,800,000 කට පොත් 20,651 ක් මිල දී ගෙන තිබුණද, ඉන් පොත් 7,028 ක් පරිහරණයට නොගෙන වසර 08 ක කාලයක් තිස්සේ පුස්තකාල ශාලාවක බිම ගොඩගසා තිබුණි. | පොත් රාක්ක ලබා ගැනීම සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇති බව. | පොත් පාඨකයන්ගේ පරිශීලනය සඳහා තැබීමට කටයුතු කළ යුතු ය. |

**1.5.7.4 සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** | | |
| (i) | එක් බැංකු ජංගම ගිණුමක ශේෂ තහවුරුව අනුව 2022 දෙසැම්බර් 31 දිනට රු.141,336 ක බැර ශේෂයක් පැවැතියද, එම ගිණුම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අදාළ නිවැරදි කිරීම් කර බැංකු සැසඳුම් සකස් කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතු ය. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට පාරිතෝෂික දීමනා සඳහා වූ රු.52,007,888 ක වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | පසුගිය අඩුපාඩු නිවැරදි කර පාරිතෝෂික ගෙවීම් පනතට අනුව කටයුතු කරන බව. | අදාල පනත අනුව කටයුතු කළ යුතු ය. |
| (ආ) | **ආදායම් කළමනාකරණය** | | |
| (i) | කඩකාමර 64 කින් 2022 වර්ෂය අවසානයට මාස 01 ත් වර්ෂ 13 ත් අතර කාලයක් පැරණි හිඟහිටි කඩකුලී රු.3,576,162 ක් විය. | හිඟ හිටි කඩ කුලී අයකරන බව. | හිඟ මුදල් කඩිනමින් අයකළ යුතු වේ. |
| (ii) | 2022 වර්ෂයේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ බස් රථ 57 කින් රු.176,112 ක දඩ අයකර නොතිබුණි. | 2023 මැයි 22 දිනට හිඟ හිටි දඩ මුදල රු.176,112ක් කඩිනමින් අය කරන බව. | දඩ හා අධිභාර අප්‍රමාදව අයකළ යුතු ය. |
| (iii) | බස් නැවතුම්පොළවල් 74 කින් 2021 හා 2022 වර්ෂවල හිඟහිටි ලොග් පත්‍ර ආදායම රු.7,462,850 ක් හා බස් රථ 46 කින් අන්තර් පළාත් පිවිසුම් ගාස්තු රු.1,134,500 ක් අයකර නොතිබුණි. එමෙන්ම, සමාලෝචිත වර්ෂය තුළ කෑගල්ල දිස්ත්‍රික්කයේ මගී සේවා අවසර පත්‍ර අලුත් නොකළ බස්රථ 556කින් රු.4,771,450 ක ගාස්තු අයකර නොතිබුණි. | දීර්ඝ කාලීනව ලොග්පත්‍ර ලබා නොගන්නා බස්රථවලට ලිඛිත දැනුම්දීම් තුනක් සිදුකර ඉන් පසු අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරිදි කටයුතු කරන බව. | ආදායම් නිවැරදිව අයකළ යුතු ය. |
| (iv) | බදු ගිවිසුම් පරිදි වර්ෂ 03 කින් තක්සේරු කළ යුතු කඩ කාමර 43 ක කුලිය, වර්ෂ 5 ක් ගත වී තිබියදීත් තක්සේරු කර නොතිබුණි. | 2023 වර්ෂයේදී කඩකාමර තක්සේරු කිරීමටත් වසර තුනකට 10%කින් ගාස්තු වැඩිකිරීමටත් කටයුතු කර ඇති බව. | ගිවිසුම පරිදි කටයුතු කළ යුතු ය. |

(ඇ) **මෙහෙයුම් සමාලෝචනය**

| | | | |
|---|---|---|---|
| (i) | 2022 දෙසැම්බර් 21 දිනැති 8/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනනුකූලව ඉකුත් වසරට අදාළ ලාභාංශ පළාත් සභා අරමුදලට ගෙවා නොතිබිය දී හා වියදම් සඳහා පළාත් භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා ගෙන තිබිය දී, 2022 වර්ෂයේ ඉතිරිකරගත් නිවාඩු මත දීමනා ලෙස රු.1,500,586 ක් ගෙවා තිබුණි. | විගණනයේ පෙන්වා දුන් උපදෙස් පරිදි කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) | ප්‍රඥප්තියේ බලතලවලට අනනුකූලව බස් හිමියන්ගේ ණය වෙනුවෙන් අධිකාරිය ඇප වී තිබුණි. ඉන් 31 දෙනෙකු රු.2,876,604 ක් ගෙවීම පැහැර හැරීම නිසා ඇපකරු ලෙස අධිකාරියට අවදානමක් පැවතුණි. | ප්‍රවාහන අමාත්‍යාංශයේ උපදෙස් මත කටයුතු කළ බව. | ප්‍රඥප්තියට පටහැනිව කටයුතු නොකළ යුතු ය. |
| (iii) | දිස්ත්‍රික් කළමණාකරු ඇතුළු තනතුරු සඳහා 09 දෙනෙකු බඳවාගෙන වැටුප් ගෙවා තිබුණු අතර තනතුරු 03 ක අනුමත ප්‍රමාණයට වඩා 52 දෙදෙනෙකු බඳවාගෙන තිබුණි. | බඳවාගැනීමේ පරිපාටි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර අදාළ කටයුතු සිදුවෙමින් පවතින බව. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව බඳවා ගැනීම් සිදු නොකළ යුතු ය. |

**1.5.7.5 සබරගමුව පළාතේ නිවාස සංවර්ධන අරමුදල**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්** | **නිර්දේශය** |
|---|---|---|
| ------------------------- | ------------------------------- | ------------- |
| අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය රු.292,959 ක් වූ අතර, එය 2017 වර්ෂයේ සිට නොවෙනස්ව පැවතුණි. ඒ අනුව, 2017 වර්ෂයේ සිට අරමුදල අක්‍රීයව පැවතිණි. | නව සභාවක් පිහිටුවීමෙන් අනතුරුව අරමුදල තර කිරීමේ ක්‍රමවේදයක් සකස් කර සුදුසු නිවාස සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමට තීරණය කර ඇති බව. | අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටු කිරීමට කටයුතු කළ යුතු ය. |

**1.5.8 ශීර්ෂය - 811- පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනත අනුව, පෞද්ගලික වෛද්‍ය ආයතන, පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ ලියාපදිංචි කළ යුතු වේ. එසේ වුවද පළාත තුළ ලියාපදිංචි නොකළ වෛද්‍ය ආයතන 68ක් පිහිටුවා පවත්වාගෙන යමින් පැවතුණි. තවද එම පනත අනුව, ලියාපදිංචි කළ ආයතන නියාමනයෙන් උපයන ගාස්තුවලින් සියයට 50 ක් පළාත් සභාවට ප්‍රේෂණය කළ වුවද, | ලියාපදිංචිය පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු සිදුකර ඇති බව. ගැටළුව ඉදිරියේදි විසඳීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉකුත් වර්ෂවල දී එම නියාමන සභාව විසින් සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට ලබා දුන් රු.3,921,192 ක් පළාත් සභාවට ප්‍රේෂණය කිරීම වෙනුවට බැංකු ජංගම ගිණුමක තැන්පත් කර තිබුණි. එම බැංකු ගිණුම පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර 2022 ඔක්තෝබර් 30 දිනට එහි ශේෂය රු.566,992 ක් විය. | | |
| (ආ) | ජල සම්පාදන ක්‍රමයක් වෙනුවෙන් ඇන්දාන ප්‍රාදේශීය රෝහලට 2018 වර්ෂයේ දී ලබාදී තිබූ රු.471,435 ක් වූ උපාංග අනාරක්ෂිතව රෝහල් භූමියේ රඳවා තිබුණි. | බට 228 ඉදිරියේදී අවශ්‍යතාවය අනුව සෞඛ්‍ය ආයතන වලට රැගෙන යාමට කටයුතු සකස් කර ඇති බව. | නිවැරදිව සැලසුම් කළ යුතු අතර, සම්පත් උපරීම ප්‍රයෝජනයට ගත යුතු ය. |
| (ඇ) | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 7,693 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයේ, පුරප්පාඩු 735 ක් පැවැති අතර, එයින් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ තනතුරු 657 ක් ද , සෞඛ්‍ය නොවන කාර්ය මණ්ඩලයේ තනතුරු 78 ක් ද පුරප්පාඩුව පැවැතිණි. සමස්ත අතිරික්ත කාර්ය මණ්ඩලය 443 ක් වූ අතර, ඉන් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ තනතුරු 143 ක් ද සෞඛ්‍ය නොවන කාර්ය මණ්ඩයේ තනතුරු 300 ක් ද විය. | තනතුරු කිහිපයක් උසස්වීම් මගින් පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබයි. මධ්‍යම රජයෙන් අනුයුක්ත කරන තනතුරු පළාත් සභාවට පාලනය කළ නොහැක. රජයේ ප්‍රතිපත්ති අනුව සංවර්ධන නිලධාරින් අනුයුක්ත කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත කාර්ය මණ්ඩල වෙනත් සුදුසු ස්ථානයකට අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතු ය. |

### 1.5.9 ශීර්ෂය - 812- පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් කොමිෂන් සභාව විසින් ගැසට් නිවේදනයක් මගින් ලබාදුන් උපදෙස් පරිදි, ඔසු වගාව දිරිමත් කිරීමට කටයුතුකර නොතිබුණි. මේ නිසා 2021 වර්ෂයේ දී පමණක් රු. 11,332,620 කට ඖෂධ වර්ග 16 ක් මිළ දී ගෙන තිබූ අතර ඉන් ඖෂධ වර්ග 14 ක් ම පළාත තුළ වගා කළ හැකි බව රත්නපුර දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විගණනය වෙත දන්වා තිබුණි. | ගැටළුව හඳුනාගෙන වගා කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ පවතින ආයතන වෙත ඖෂධ වර්ග නම් කර එම වගා සම්බන්ධයෙන් ඉලක්ක හා වගකීම් පවරා ඇති බව. | පළාත තුළ වගා කළ හැකි ඖෂධ වර්ග වගා කිරීමට දිරිමත් කළ යුතු වේ. |
| (ආ) | රජවක ඖෂධ වගා හා සංරක්ෂණ ව්‍යාපෘතිය මගින් 1998 වර්ෂයේ සිට වර්ෂ 06 ක කාලයක් තුළ ඉටුකළ ඖෂධ පැළැටි සංරක්ෂණ කටයුතු 2004 වර්ෂයේ දී ග්‍රාමීය ප්‍රජා සංවිධානයක් වෙත පවරා දී තිබුණි. එතැන් පටන් එම සංරක්ෂණ කටයුතු | සංවර්ධන කටයුතු සිදුවෙමින් පවතින බව. | ඖෂධ පැළැටි සහ ඔසු උයන්වල සංරක්ෂණ කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුළුමනින්ම අසාර්ථක වී තිබුණු අතර ඔසු උයන් කාර්යාලය සහ අක්කර 02 ක වගා භූමිය වල් බිහි වී ඊට අයත් සම්පත් විනාශ වෙමින් පැවතුණි. | | |
| (ඇ) | ආයුර්වේද රෝහල් 02 ක පැවැති 2019 වර්ෂයේ මිල දී ගත් රු. 1,197,875 ක් වූ සෙමෙන් නිකුත් වන ඖෂධ අතිරික්තයක් පැවැතුණි. | ඉදිරියේ දී අවශ්‍ය රෝහල් වෙත නිකුත් කිරීමට කටයුතු යොදන බව. | එම ඖෂධ කල් ඉකුත් වීමට පෙර නිකුත් කළ යුතු වේ. |

**1.5.9.1 පින්නවල පංචකර්ම ඒකකය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2019-2022 වර්ෂ අතර කාලයට අදාළ රු.506,931 ක සමුච්චිත ක්ෂය වටිනාකම, මූල්‍ය රීති 377-1 පරිදි ක්ෂය සංචිත අරමුදලට බැර කිරීම සඳහා පළාත් භාණ්ඩාගාරය වෙත දන්වා යවා නොතිබුණි. | ලැබෙන ආදායම් තත්ත්වය මත කඩිනමින් වාර්ෂික ක්ෂය ප්‍රමාණය ක්ෂය සංචිත අරමුදලට බැර කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.10 ශීර්ෂය -813 - පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 43 (ආ) වගන්තිය පරිදි, සියලු ලියාපදිංචි සමුපකාර සමිති මුදල් වර්ෂය අවසන් වී මාස 03 ක් ඇතුළත අවසාන ගිණුම් ඉදිරිපත් කළ යුතු ය. එහෙත්, කෑගල්ල දිස්ත්‍රික්කයේ සමිති 335 න් සමිති 163 ක් ම 2022 වර්ෂයේ අවසාන ගිණුම් 2023 අප්‍රේල් දක්වාම ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම, ප්‍රඥප්තියේ 44(i) වගන්තිය පරිදි එම සමිති වාර්ෂිකව විගණනය කළ යුතු වුවද, සබරගමුව පළාතේ ක්‍රියාකාරී සමිති 570 න් සමිති 172 ක් 2013 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා විගණනය කර නොතිබුණි. | සමුපකාර සමිතිවලට සිහිකැඳවීම් ලිපි යොමු කිරීමට කටයුතු යොදා ඇත. සී/ස කඩිගමුව සණස සමිතිය අක්‍රිය තත්වයේ පවතින අතර මෙම සමිතිය ඈවර කටයුතු සඳහා යොමු කර ඇති බව. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අංක 2011/18 දරන 2011 ජනවාරි 03 දිනැති සමුපකාර සංවර්ධන කොමසාරිස් චක්‍රලේඛයේ 9 වගන්තියට අනනුකූලව, සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ අනුමැතිය නොමැතිව 2021 හා 2022 වර්ෂවල කෑගල්ල දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති 06 කින් රු.60,143,000 ක් ද, රත්නපුර දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිති 03 කින් රු.112,159,000 ක් ද ග්‍රාමීය බැංකු අංශයෙන් අනෙකුත් අංශ වෙත මාරුකර තිබුණි. | 2021 හා 2022 වර්ෂ වල පැවති මූල්‍ය අර්බුදය නිසා ග්‍රාමීය බැංකු අංශය සතු මුදල් වෙනත් ව්‍යාපාරික අංශවල කටයුතු සඳහා ලබා ගැනීමට හේතු වූ බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**1.5.11 ශීර්ෂ අංක - 814 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | -------------------------------- | ------------- |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ආදායම් ඒකරාශි කිරීමේ සැලැස්මක් හා ආදායම් අයකිරීමේ ප්‍රගතිය කාර්තුමය වශයෙන් විමර්ශනය කිරීමක් සිදුකර නොතිබුණි. මේ නිසා පළාතේ පළාත් පාලන ආයතනවල 2022 දෙසැම්බර් 31 දිනට හිඟ සහ ප්‍රවර්තන ආදායම් අයකිරීමේ ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු ප්‍රතිශතයක පැවැතිණි. | ආදායම් අයකරගැනීමේ ප්‍රගතිය ඉහළ නංවා ගැනීමට කටයුතු කරන බව | ආදායම් ඒකරාශි කිරීමේ සැලැස්මක් සකස් කර ආදායම් අයකිරීමේ ප්‍රගතිය ඉහළ නංවා ගත යුතු ය. |

**1.5.12 ශීර්ෂය- 820- පළාත් මාර්ග සංවර්ධනය,ග්‍රාමීය යටිතල පහසුකම් , සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු පළාත් අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------------- | ------------- |
| (අ) | මාර්ග නාමපුවරු 1046 ක් රු.15,063,060 කට සපයා සවි කිරීමට 2016 වර්ෂයේ දී භාරගත් කොන්ත්‍රාත්කරු එම කාර්යය පැහැර හැර තිබුණි. ඒ සඳහා, දින 681 ක් එනම්, ගිවිසුම්ගත කාලය මෙන් සියයට 567 කින් දින දීර්ඝ කිරීම් ලබා දීමට පළාත් මාර්ග අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව කටයුතු කිරීම නිසා රු.752,653 ක් ප්‍රමාද දඩ අයකිරීමට තිබුණු හැකියාව අහිමි වී තිබුණි. පසුව, නිමකළ නාමපුවරු ප්‍රමාණය පිළිගෙන කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට ද එම කමිටුව තීරණය කර තිබුණි. කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කර ගිවිසුම කඩ කිරීම නිසා රු.754,000 ක කාර්යසාධන සුරක්ෂණය අයකිරීම වෙනුවට, අඩක් නිමි නාමපුවරු 155 ක් වෙනුවෙන් රු.1,458,567 ක් ගෙවීමට ද පියවර ගෙන තිබුණි. | විස්තරයේ අඩුපාඩු සහිත නාම පුවරු, වැරදි ස්ථානවල සවිකර ඇති නාම පුවරු, නිසිපරිදි සවිකර නොමැති නාම පුවරු සඳහා සම්පූර්ණ ගාස්තුව නොගෙවා ගාස්තුවෙන් අඩක් ගෙවීමට කටයුතු කර ඇති බව. අමු ද්‍රව්‍ය සපයා ගැනීමේ අපහසුව හා නාම පුවරු ස්ටිකරය මුද්‍රණයට අධික කාලයක් ගතවීම පිළිබඳව සලකා බලා දෙවන කල් දිගුව ලබා දී ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කළ යුතු අතර වැඩ අවසන් නොකළ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉදි කිරීම් සඳහා 2006 හා 2007 වර්ෂවල දී ලබාදුන් අත්තිකාරම් රු. 4,812,644 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 15 ක් ඉක්මවා තිබුණද, නිරවුල්කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව බේරුම්කරණය වෙත යොමු වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට නීතිපති වෙත යොමු කර ඇති බව. | රජයට සිදුවී ඇති අලාභය අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.13 ශීර්ෂය 821- පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සබරගමුව පළාත් ක්‍රීඩා ප්‍රඥප්තිය අනුව ක්‍රීඩා මණ්ඩල පිහිටුවීම, ක්‍රීඩා සංවර්ධනය, ක්‍රීඩා අරමුදලක් පැවැත්වීම, ක්‍රීඩා සංගම් ලියාපදිංචිය හා අධීක්ෂණය, ක්‍රීඩා ශිෂ්‍යත්ව හා ශිල්පායතන පිහිටුවීම යන කාර්යයන් 2023 පෙබරවාරි දක්වාම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉටුකර නොතිබුණි. | ක්‍රීඩා ඒකකය විවිධ අමාත්‍යාංශ වලට මාරුවීම නිසා හා පළාත් සභාව විසුරුවා හැරීම නිසා ක්‍රීඩා විෂයයට අමාත්‍යවරයෙක් නොසිටි බැවින් ප්‍රඥප්තියේ විධි විධාන ක්‍රියාත්මක කිරීමට බලතල නොපැවතුණු බව. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | 47 වන ජාතික මහා ක්‍රීඩා උළෙල වෙනුවෙන් අන්තර් කොට්ඨාශ ක්‍රීඩා සඳහා 680 දෙනෙකු සුදුසුකම් ලැබුව ද , ඔවුන් සියලු දෙනා සහභාගි කරවීමට හැකිවන පරිදි සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව සතුව නොතිබීම නිසා ඉන් 545 දෙනෙකුට සබරගමුව පළාත නියෝජනය කිරීම සඳහා ඉදිරිපත් වීමට නොහැකි වී තිබුණි. | ජූලි අගෝස්තු මාසවල දී ප්‍රථම අදියර තරඟ පවත්වන ලදී. 2022 දෙසැම්බර් වන විට අත්තිකාරම් පියවා අවසන් කර ඇති බව. | අත්තිකාරම් නියමිත කාර්යය අවසන් වූ වහාම පියවිය යුතු ය. |

**1.5.14 ශීර්ෂය 830- සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත පළාත් අමාත්‍යාංශය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2007 වර්ෂයේ සිට පැවැත එන නොපියවූ උප අග්‍රිම ශේෂයක් වන රු.960,475ක් සමාලෝචිත වර්ෂය තුළ දී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | බේරුම්කරණ ක්‍රියාවලියකට යොමු වීමට නීතිපති සහය ඉල්ලා ඇති බව. | රජයට සිදුවී ඇති අලාභය අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.1 4.1** පළාත් සමාජ සේවා අරමුදල

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| අරමුදල විසින් රු.61,000,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණද, මෙම අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 06 ඡේදය ප්‍රකාරව, අසරණ හා ආබාධිත දරුවන් සඳහා පෝෂණ හා අධ්‍යාපන ආධාර ලබා දීමේ කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර නොතිබුණි. | ආධාර ලබාදීමට අවශ්‍ය ව්‍යාපෘති වාර්තා මේ වන විට සකස් කරමින් පවතින බව. | ප්‍රඥප්තිය ප්‍රකාරව අරමුදල් යෙදවීමට කටයුතු කළ යුතුය. |

**1.5.15 ශීර්ෂය 831-** පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව

**1.5.15.1** පේෂ කර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි මධ්‍යස්ථාන 03 ක් වසා දැමීම හේතුවෙන් රු.6,200,000 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 2007 වර්ෂයත් 2017 වර්ෂයත් අතර කාලයක් නිශ්කාර්යව පැවතුණි. | මෙම වත්කම් අදාල ප්‍රාදේශීය ලේකම් වෙත භාරදීමට කටයුතු කර ඇති බව. | වත්කම් උපයෝජනයට හෝ සුදුසු පරිදි වෙනත් කාර්යයක් සඳහා යෙදවීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | 2011-2022 වර්ෂ අතර කාලයට අදාළ රු.40,448,121 ක ක්ෂය වටිනාකම, මූල්‍ය රීති 377.1 පරිදි ක්ෂය සංචිත අරමුදලට බැර කිරීම පිණිස පළාත් භාණ්ඩාගාරය වෙත දන්වා යවා නොතිබුණි. | මූල්‍ය තත්වය යහපත් වූ පසු පළාත් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන බව. | මූල්‍ය රීති පරිදි කටයුතු කළ යුතු ය. |
| (ඇ) | 2014-2022 වර්ෂ අතර කාලයට අදාළ රු.20,217,320 ක් වූ ශුද්ධ ලාභය මූල්‍ය රීති 378.2 අනුව, පළාත් සහා විවිධ ආදායම් ශීර්ෂයට බැරකර නොතිබුණි. | මූල්‍ය තත්වය යහපත් වූ පසු පළාත් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන බව. | මූල්‍ය රීති පරිදි කටයුතු කළ යුතු ය. |

**1.5.16 ශීර්ෂය - 840-** අධ්‍යාපන , තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු පළාත් අමාත්‍යාංශය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධ්‍යාපන අමාත්‍යාංශයට පසුගිය වසර 03 තුළ ලද විනය පැමිණිලි 70 න් 39 ක් එනම් සියයට 56 ක් 2023 පෙබරවාරි වන විටත් විභාග කිරීම අවසන් කර නොතිබුණි. | කලාප අධ්‍යාපන කාර්යාල වෙත අදාළ වාර්තා ලබා දීම සඳහා යොමු කර ඇති බව. | විනය පරීක්ෂණ කඩිනමින් අවසන් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ර/පුස්සැල්ල මහා විද්‍යාලයේ ගොඩනැගිල්ලක අතුරා තිබුණු ටයිල් කැටවලින් කොටසක් ගැලැවී ගොස් තිබීම හා ඉදි කළ ජල ටැංකි රඳවනයෙන් අපේක්ෂිත උපයෝජනය නොලැබීමෙන් ඒවා වෙනුවෙන් වැය කළ රු. 645,994 ක් අනාර්ථික වියදමක් වී තිබුණි. | ඉදි කිරීම් කටයුත්තෙන් රැඳවුම් මුදල නොගෙවා එම අඩු පාඩු සකස් කිරීමට තීරණය කර ඇති බව. | අඩුපාඩු සම්බන්ධව ගිවිසුම පරිදි කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ර/අයගම ශ්‍රී රාහුල මධ්‍ය මහා විද්‍යාලයේ 2015 වර්ෂයේ ඉදිකරමින් පැවති වැසිකිලි පද්ධතිය 2016 ජුනි මාසයේ දී ඉදිකිරීම් අත්හැර දැමීම නිසා ඒ වෙනුවෙන් වැයකළ රු.1,879,920 ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පත්කළ විමර්ශන කමිටුව විසින් 2019 පෙබරවාරි මාසයේ සිය වාර්තාව ලබා දී 2022 දෙසැම්බර් වන විට වර්ෂ 03 ක් ගත වී තිබුණ ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මේ නිසා එම වාර්තාව පරිදි සිදු වී තිබුණු රු.506,062 ක් මූල්‍යමය හානිය හා රු.77,310 ක සාවද්‍ය ගෙවීම පියවා ගත නොහැකි වී තිබුණි. | වාර්තාව ලැබුණු පසු ඉදිරි කටයුතු සිදු කරන බව. | රජයට සිදු වී ඇති මූල්‍යමය අලාභ අයකළ යුතු ය. |
| (ඈ) | ළගම පාසල හොඳම පාසල ව්‍යාපෘතියේ රු.මිලියන 500.98 ක ඉදි කිරීම් 24 ක් අත්හැර දමා තිබුණි. | අක් මුදල් ලැබීමේ ප්‍රමාදය සහ ඉදිකිරීම් අඛණ්ඩව ඉටු කිරීමට විවිධ බාධා පැවැතීම නිසා මෙම කර්මාන්ත අතරමඟ නවතා දැමීමට සිදු වූ බව. | මෙම ගොඩනැඟිලි ප්‍රයෝජනට ගත හැකි තත්ත්වයට පත් කළ යුතු ය. |
| (ඉ) | ඉදිකිරීම් කර්මාන්ත 03 ක් සඳහා 2017 වර්ෂයේ දී ලබා දී තිබුණු රු.3,321,323 ක් වූ අත්තිකාරම් 2022 දෙසැම්බර් 31 දින දක්වා පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බිල්පත් ලද වහාම මෙම අත්තිකාරම් පියවන බව. | අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතු ය. |

**1.5.16.1 සබරගමුව පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ------------------------------- | ------------- |
| සබරගමුව පළාත තුළ වූ සියලුම පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම අධිකාරියේ ප්‍රධාන කාර්යයභාරය වුවත්, 2022 දෙසැම්බර් වන විට පළාත තුළ ලියාපදිංචි නොකළ පෙර පාසල් 360 ක් පැවැති අතර ලියාපදිංචි පෙර පාසල් 1,407 කින් පෙර පාසල් 941 ක් 2022 වර්ෂය සඳහා ලියාපදිංචිය අලුත්කර නොතිබුණි. | ලියාපදිංචිය යාවත්කාලීන නොකළ පෙර පාසල් 941 න් පෙර පාසල් 366 ක් මේ වන විට ලියාපදිංචිය ලබා ඇති බව. | ලියාපදිංචිය නොකළ පෙර පාසල් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු ය. |

**1.5.17 ශීර්ෂය - 841 - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධ්‍යාපන කාර්යාල 07 ක හා පාසල්වල වූ නිල නිවාස 585 න් නිවාස 195 ක් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේද, නිල නිවාස 74 ක් භාවිතයට නුසුදුසු තත්ත්වයේද පැවති අතර නිවාස 63 ක් වෙනත් කාර්යයන් සඳහා යොදාගෙන තිබුණි. | නිල නිවාස අලුත්වැඩියා කර භාවිතයට ගතහැකි තත්ත්වයට පත්කර ගැනීමට අවශ්‍ය කටයුතු හැකි ඉක්මනින් සිදුකරන බව . | වත්කම් අරමුණුගත කාර්යයන් සඳහා යෙදවිය යුතු වේ. |
| (ආ) | පළාත් අධ්‍යාපන කාර්යාලය, කලාප කාර්යාල, පාසල් 1080 ක ඉඩම් ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය වන තක්සේරු කිරීම් සිදුකර නොතිබුණි. | තක්සේරු ක්‍රියාවලිය ප්‍රමුඛ අවශ්‍යතාවයක් ලෙස සළකා ඊට අදාළ කටයුතු ආරම්භ කර ඇති බව. | ජංගම නොවන වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |
| (ඇ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට කාර්යය මණ්ඩල තොරතුරු පරීක්ෂාවේ දී ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ ද්වීතික මට්ටමේ තනතුරු 13 ක ඌනතාවක් පැවති අතර, සංවර්ධන නිලධාරි සේවයේ 10 දෙනෙකුගේ සහ තොරතුරු තාක්ෂණ නිලධාරි සේවයේ එක් අයෙකුගේ අතිරික්තයක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අදාළව ඉල්ලීම් සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් හා අධ්‍යාපන ලේකම් වෙත යොමුකර ඇත. අතිරික්ත නිලධාරීන් පිළිබඳ තොරතුරු ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත කාර්ය මණ්ඩල සුදුසු පරිදි අනුයුක්ත කිරීමටත් කටයුතු කළ යුතු ය. |
| (ඈ) | සබරගමුව පළාතේ අනුමත ගුරු කාර්ය මණ්ඩලය 24,401 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 20,758 ක් වීමෙන්, ගුරු ඌනතාවය 3643 ක් විය. | පිළිගන්නා බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය. |
| (ඉ) | කලාප අධ්‍යාපන කාර්යාලවල සංවර්ධන නිලධාරී තනතුරු 819 ක් ද, පාසල් කාර්ය මණ්ඩලය තුළ සංවර්ධන නිලධාරී තනතුරු 1349 ක් ද වන පරිදි සබරගමුව පළාත තුළ සංවර්ධන නිලධාරීන් 2168 දෙනෙකුගේ අතිරික්තයක් පැවැතිණි. | අවශ්‍ය ප්‍රමාණයට වඩා රජය විසින් මෙම බඳවා ගැනීම සිදු කර ඇත. මේ නිසා ඔවුන් සඳහා ආයතන තුළ පුරප්පාඩු නොමැති බැවින් කලාප සහ පාසල් වෙත අනුයුක්ත කිරීමට සිදු වී ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර අතිරික්තය සුදුසු පරිදි අනුයුක්ත කළ යුතු ය. |
| (ඊ) | සබරගමුව පළාතේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු 05 ක් ද, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු 14 ක් ද, කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු 02 ක් ද පුරප්පාඩුව පැවැති අතර එක් කලාප අධ්‍යාපන කාර්යාලයක නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු 05 ක් අතිරික්තව පැවතුණි. | මෙහි පවතින පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කිරීමට අදාළව ඉල්ලීම් සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් වෙත දන්වා ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත කාර්ය මණ්ඩල වෙනත් සුදුසු ස්ථානයකට අනුයුක්ත කිරීමටත් කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (උ) | කැගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ පාසැල් කාර්යය මණ්ඩලය තුළ ගුරු උපදේශක සිංහල මාධ්‍ය තනතුරු 10 ක් ද, ගුරු උපදේශක දෙමළ මාධ්‍ය තනතුරු 01 ක් ද, දෙහිඕවිට කලාප අධ්‍යාපන කාර්යාලයේ පාසැල් කාර්යය මණ්ඩලය තුළ ක්‍රීඩා පුහුණුකරු තනතුරු 55 ක් ද අනුමත කරවා ගැනීමකින් තොරව රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන මත සේවයේ යොදවා තිබුණි. | පළාත් සභා පාසල් ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා වැටුප් ගෙවනු ලබන්නේ මධ්‍යම රජය රේඛීය අමාත්‍යාශ ප්‍රතිපාදන මගිනි. පලාත් සභා අනුමත සේවක සංඛ්‍යාව තුළ මෙම නිලධාරීන්ව ඇතුළත් කර නොමැති බව. | අතිරික්ත කාර්ය මණ්ඩල වෙනත් සුදුසු ස්ථානයකට අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඌ) | පළාත තුළ, විදුහල්පති තනතුරු 475 ක් ද, නියෝජ්‍ය විදුහල්පති තනතුරු 67 ක් ද, සහකාර විදුහල්පති තනතුරු 116 ක් ද පුරප්පාඩුව පැවති අතර මාවනැල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජ්‍ය විදුහල්පති තනතුරු 14 ක් අතිරික්තව පැවතුණි. පාසල් 397 ක විදුහල්පති තනතුරු සඳහා නිත්‍ය පත්වීමක් සිදු නොකර, මාස 03 ත් වසර 32 ත් අතර කාලයක සිට වැඩබලන විදුහල්පතිවරු ලෙස ගුරු සේවයේ නිලධාරින් 397 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. | පළාත තුළ, විදුහල්පති තනතුරු , නියෝජ්‍ය විදුහල්පති තනතුරු, සහකාර විදුහල්පති තනතුරු එකතුව අනුමත සංඛ්‍යාව 1453 ක් වන අතර, තථ්‍ය සංඛ්‍යාව 752 ක් විය. ඒ අනුව පුරප්පාඩු 701ක් පැවැතුණ බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | කලාප අධ්‍යාපන කාර්යාල 06 කට අයත් පාසල් 271 ක 2008 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ ගුරු සේවයට පත්වීම් ලද ගුරුභවතුන් 512 කගේ සේවය ස්ථිර කිරීමට 2022 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. | අසම්පූර්ණ ලිපිලේඛන , ලිපි භාර දීම ප්‍රමාදය, නිවාඩු අනුමත නොවීම, සනාථ නොවූ විභාග ප්‍රතිඵල, පෞද්ගලික ලිපිගොනු ලැබීම ප්‍රමාද වීම, මොඩියුලය සම්පූර්ණ නොවීම, මූලික විමර්ශනයන්ට භාජනය වීම ගුරුභවතුන්ගේ සේවය ස්ථිර කිරීම ප්‍රමාද වීමට හේතු වූ බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඒ) | වෙනත් ආයතනවලට මුදාහල ගුරුභවතුන් 32 දෙනෙකුගෙන් ගුරුභවතුන් 15 දෙනෙකු වෙනුවෙන් මුදාහල දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා සේවයට වාර්තා කිරීම්, පැමිණීම් හා පිටවීම් වාර්තා, නිවාඩු වාර්තා සහ මුදාහල ආයතනවලින් ලබාගත් දීමනා පිළිබඳ වාර්තා ආදිය පිළිබඳ කිසිදු තහවුරු කර ගැනීමකින් තොරව කලාප කාර්යාල විසින් වැටුප් වශයෙන් ගෙවා තිබුණු රු.20,575,366 ක් ප්‍රතිපූර්ණයෙය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙහිඕවිට මුදාහල නිලධාරින් පිළිබඳව තොරතුරු ලබා ගෙන තිබුණ ද, අනෙකුත් කළාපවල නිලධාරින්ගේ තොරතුරු ලබාගෙන නොමැති බව. | නිලධාරින්ගේ තොරතුරු ලබාගෙන වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

**1.5.18 ශීර්ෂය 850- ඉඩම්, පළාත් වාරි මාර්ග , කෘෂිකර්ම , සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පළාත් අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ නිමකළ වාරි කර්මාන්ත 07 ක ඉටුනොකළ වැඩ වෙනුවෙන් රු.582,800 ක් ගෙවා තිබුණි. | නොකළ වැඩ වෙනුවෙන් රු.732,325 ක මුදලක් ගෙවා ඇති බව. | නොකල වැඩ වෙනුවෙන් ගෙවූ මුදල් කඩිනමින් අයකළ යුතුය. |

**1.5.19 ශීර්ෂ අංක - 851 - පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ජල ව්‍යාපෘති 06 කට අදාළව එකතු වටිනාකම රු.2,465,059 ක් වූ හිඟ ජල බදු අයකර නොතිබුණි. | මේ දක්වා මුදල් ගෙවා නොමැති බව. | හිඟ ජල බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට හිඟහිටි රු.90,230,365 ක ඉඩම් බදු ශේෂයක් අයකර නොතිබුණු අතර ඉන් රු.30,962,117 ක් වර්ෂ 02 කට වඩා පැරණි විය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් හිඟ බදු තොරතුරු කැඳවා හිඟ බදු අය කර ගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය රීති ප්‍රකාරව කඩිනමින් හිඟ හිටි බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සබරගමුව පළාත තුළ 2019 - 2022 වර්ෂ අතර ලද මිනුම් ඉල්ලීම් 615 ක් ඒ ඒ වර්ෂයේ දී දෙපාර්තමේන්තුවේ මානක නිලධාරී වෙත යොමුකර තිබුණ ද, ඉන් ඉල්ලීම් 526 ක් එනම් සියයට 85 ක මිනුම් කටයුතු 2022 සැප්තැම්බර් මාසය වන විටත් සිදුකර නොතිබුණි. | මිනින්දෝරු නිලධාරීන් ලබා දෙන ලෙස ඉල්ලා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත දන්වා ඇති බව. | ඉඩම් මිනුම් කටයුතු කඩිනමින් නිම කළ යුතුය. |

**1.5.20 පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| "සජීව්‍යා" කාබනික පොහොර වැඩසටහනේ ව්‍යාපෘති වාර්තාව අනුව හඳුනාගෙන තිබූ සබරගමුව පළාතේ කාබනික පොහොර අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 45,665 ක් විය. එම ඉලක්කය දෙවසරක් තුළ සම්පූර්ණ කර ගැනීම එම වැඩසටහනේ මූලික අරමුණ විය. එහෙත්, එම දෙවසරෙහි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 8,950 ක් වූ අතර අරමුණු ඉටු කිරීමේ සාර්ථකතාව සියයට 19.6 ක් විය. ඒ අනුව ව්‍යාපෘතිය වෙනුවෙන් 2020 හා 2021 | නැවත රසායනික පොහොර ගෙන්වීම නිසා ජනතාවගේ මෙම උද්යෝගය පසුබෑමකට ලක් වූ අතර මෙම ඉලක්කය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ බව. | පළාත තුළ කාබනික පොහොර භාවිතය වැඩි කරවීමට ජනතාව පෙළඹවීමට කටයුතු කළ යුතුය. |

වර්ෂවල දරා තිබූ රු.73,700,000 ක් අනාර්ථික වියදමක් වී තිබූ අතර මෙම වැඩසටහන නැවත සාර්ථක කර ගැනීම සඳහා කිසිදු වැඩ පිළිවෙලක්ද නොවුණි.

**1.5.21 ශීර්ෂය - 853- සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------------- | ------------- |
| (අ) | පුද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යන පශු වෛද්‍ය කාර්යාල 04 ක් වෙනුවෙන් 1993 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කුලී ලෙස රු.4,213,900 ක් ගෙවා තිබුණ ද, ඒවා රජයේ ගොඩනැගිලිවල පවත්වා ගෙන යාමට ඇති හැකියාව සොයා බලා නොතිබුණි. | රජයට අයත් ගොඩනැගිලි ප්‍රදේශය තුළ සොයා ගත නොහැකි අවස්ථාවල කුලී ගොඩනැගිලිවල කාර්යාල පවත්වාගෙන යාමට සිදුව ඇති බව. | රජයේ කාර්යාල, රජයේ ගොඩනැගිලිවල පවත්වාගෙන යාමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු වේ. |
| (ආ) | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 06 ක් කිසිදු අලුත්වැඩියාවකින් තොරව 2014 වර්ෂයේ සිට අභාවිතව පවතී. | ඉදිරියේ දී වෙන් වන ප්‍රතිපාදන ප්‍රමාණය අනුව නිල නිවාස අලුත්වැඩියාව සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බව. | නිසි කාලපරිච්ඡේදය තුළ නිල නිවාසවල නඩත්තු කටයුතු සිදු කළ යුතුය. |

**1.5.21.1 උඩුගොඩ සත්ත්ව පාලන, සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------------- | ------------- |
| (අ) | සත්ත්ව ආහාර වර්ග 02 ක පැවැතිය යුතු අත්‍යවශ්‍ය පෝෂණ සංඝටක අනුමත සීමාව තුළ නොමැති බව පශු වෛද්‍ය පෝෂණ ආයතනය තහවුරු කර තිබුණි. එබැවින්, රු.1,527,750 ක් වූ එම සත්ව ආහාර කි.ග්‍රෑ. 10,000 ක් ප්‍රතික්ෂේප කර ආපසු හරවා යැවීම වෙනුවට තවදුරටත් එම ආහාර සතුන් වෙත නිකුත් කර තිබුණි. | ඌන පෝෂිත ආහාර ගබඩාවෙන් ඉවත් කරගන්නා ලෙස සැපයුම්කරු දැනුවත් කර තිබුණු බව. | සත්ව ආහාර නිකුත් කිරීමේදී නිසි සැලකිල්ලක් දැක්විය යුතුය. |
| (ආ) | අක්කර 20 ක පමණ භූමි ප්‍රමාණයක් වල් බිහි වී උපයෝජනයකින් තොරව පැවතිණි. | ගොවිපල සතු භූමි ප්‍රමාණය පූර්ණ භාවිතයට ගැනීමට කටයුතු කරන බව. | භූමි ප්‍රමාණය උපරිමව භාවිතා කළ යුතුය. |
| (ඇ) | කුකුළු ඒකකය පැවැති රු.3,500,000 ක් වූ ගොඩනැගිලි 04 ක්, 2018 දෙසැම්බර් මාසයේදී ලද රු.232,050 ක් වූ කොන්ක්‍රීට් කණු 273 ක් හා නිල නිවාසයක් 2021 ඔක්තෝබර් සිට නිෂ්කාර්යයව පැවැතිණි. | 2023 වර්ෂයේ සිට ගොඩනැගිලි සියල්ලම භාවිතයට ගෙන නිෂ්පාදන කටයුතු සිදුකිරිමටත් කොන්ක්‍රීට් කණු සිටුවා අවසන් කිරිමට කටයුතු කරන බව. | නිෂ්කාර්යයව පවතින වත්කම් කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |